

**13.** පහත රූපයේ ඇති සංඛ්‍යා රටාව අනුව හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.




**14.** 1 සිට 25 තෙක් සියලු ම ඔත්තේ සංඛ්‍යා ලිවීමේදී 1 ඉලක්කම ලිවීමට සිදු වන වාර ගණන කීය ද?

(1) 7 (2) 8 (3) 13

**15.** 

මෙම රූපයෙන් $\frac{3}{5}$ ක කොටසක් පාට කිරීම සඳහා පාට කර ඇති කොටුවලට අමතරව තවත් කොටු කීයක් පාට කළ යුතු ද?

(1) 8 (2) 10 (3) 12

**16.** වාහන හිමි සියල්ලෝම පොහොසත්තු නොවෙති. එසේ නම්,

(1) පොහොසත්තු කිසිවිටෙකත් වාහන හිමියෝ නොවෙති.

(2) වාහන හිමියන් නොවන සියල්ලෝම පොහොසත්තු වෙති.


(3) සමහර වාහන හිමියෝ පොහොසත්තු නොවෙති.

**17.** හිස්තැනට සුදුසු වචනය තෝරන්න.

වංගෙඩිය : මෝල්ගහ නම්, ඔරුව : .................

(1) හබල (2) පාරුව (3) ජලය


**18.** පහත රූපයේ දැක්වෙන්නේ කමල් ද ඇතුළුව සිසුන් 20 දෙනෙකු රවුමට පෙළගැසී සිටින ආකාරයයි.




ඔවුන් සියලු දෙනාම කමල්ගේ සිට පිළිවෙළින් 1, 2, 3, 1, 2, 3, ....... වශයෙන් කියමින් වට දෙකක් ගණන් කරයි. මේ ආකාරයට පළමු වටයේදී 1 කියා ගණන් කරන කමල් දෙවන වටයේදී ගණන් කරන විට කියන ඉලක්කම කුමක් ද?

(1) 1 (2) 2 (3) 3

**19.** එක සමාන සමචතුරස්‍ර පහක් එක පේළියට තබා සකස් කරන ලද පහත රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සෙන්ටිමීටර 180කි. මෙහි එක් සමචතුරස්‍රයක වර්ගඵලය වර්ග සෙන්ටිමීටර කීය ද?



(1) 225 (2) 256 (3) 400

**20.** දින 31ක් සහිත මාසයක අඟහරුවාදා, බදාදා හා බ්‍රහස්පතින්දා දින පහක් බැගින් තිබේ. එම මාසයේ 24 වැනිදා කුමන දවසක් ද?


(1) බදාදා (2) බ්‍රහස්පතින්දා (3) සිකුරාදා

**21.** අඹ ගෙඩියක මිල රුපියල් 25කි. ඇපල් ගෙඩියක මිල රුපියල් 40කි. අඹ හා ඇපල් දෙවර්ගයෙන්ම කිසියම් ගෙඩි සංඛ්‍යාවක් බැගින් මිල දී ගැනීමට චමෝදිට වැය වූ මුදල රුපියල් 205කි.

චමෝදි මිල දී ගත් අඹ ගෙඩි ගණන කීය ද?

(1) 2 (2) 4 (3) 5


**22.** පහත දැක්වෙන්නේ පෙරවරු 6.45ට කොළඹ සිට මාතර බලා පිටත්ව නොවෙනස් වේගයකින් නොනවත්වා ධාවනය වූ බස් රථයක ගමන් විස්තරයකි.




| ළඟා වූ නගරය | නගරයේ පිහිටා ඇති කිලෝමීටර කණුව | ළඟා වූ වේලාව |
|---|---|---|
| ගාල්ල | 120 km | පෙරවරු 10.45 |
| මාතර | 165 km | ............... |

ඒ අනුව, බස් රථය මාතර නගරයට ළඟා වන්නේ පස්වරු කීයට ද?


(1) 12.15 (2) 12.30 (3) 12.45

**23.** 


මෙම රූපයේ දැක්වෙන්නේ පැති හය A, B, C, D, E සහ F ලෙස සලකුණු කර ඇති එකම දාදු කැටයක පිහිටීම් තුනකි.

ඉහත දාදු කැටයේ D අක්ෂරය සලකුණු කර ඇති පැත්තට ප්‍රතිවිරුද්ධ පැත්තේ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(1) A (2) B (3) F

**24.** 


A, B, C හා D කණ්ඩායම් හතරේ සිටින ළමයින් සංඛ්‍යා මෙම රූප සටහනෙන් නිරූපණය කෙරේ.

A කණ්ඩායමේ සිටින ළමයින් සංඛ්‍යාව 48කි. ඒ අනුව, B හා C කණ්ඩායම් දෙකේම සිටින මුළු ළමයින් සංඛ්‍යාව කීය ද?

(1) 24 (2) 36 (3) 42


**25.** ඉලක්කම් හතරකින් යුත් සංඛ්‍යාවක් තිබේ. එම සංඛ්‍යාවේ,

* පළමුවැනි ඉලක්කම, හතරවැනි ඉලක්කම මෙන් පස්ගුණයකි.
* දෙවැනි ඉලක්කම, තුන්වැනි ඉලක්කම මෙන් හතරගුණයකි.

එම සංඛ්‍යාව පහත දී ඇති සංඛ්‍යා අතුරෙන් කුමක් විය හැකි ද?

(1) 5182 (2) 5281 (3) 5821

- ගස්වල පිපෙන මල්, වැල්වල පිපෙන මල්, අරලිය මල් හා මල් අතර සම්බන්ධතාව පහත රූපයෙන් නිරූපණය කෙරේ. ඒ ඇසුරෙන් අංක **26** සහ **27** ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.




**26.** අරලිය මල් නිරූපණය කෙරෙන අක්ෂරය කුමක් ද?


(1) P (2) R (3) S

**27.** Q මගින් නිරූපණය කෙරෙන මල් වර්ගයක් වීමට ඉඩ ඇත්තේ පහත ඒවායින් කුමක් ද?

(1) සමන්පිච්ච (2) වතුසුදු (3) සේපාලිකා

[හයවැනි පිටුව බලන්න

**28.** මෙම ප්‍රස්තාරයේ දැක්වෙන්නේ එක්තරා කාලයක් තුළ මාර්ගයක ගමන් කළ වාහන පිළිබඳ තොරතුරු වේ. එම කාලය තුළදී මාර්ගයේ ගමන් කළ යතුරු පැදි සංඛ්‍යාව සමාන වන්නේ පහත කුමන වාහන වර්ග දෙකේ සංඛ්‍යාවල එකතුවට ද?





(1) බස් රථ හා මෝටර් රථ
(2) මෝටර් රථ හා ත්‍රිරෝද රථ
(3) ත්‍රිරෝද රථ හා බස් රථ

**29.** එක්තරා නගරයක පාසල පිහිටා ඇත්තේ ක්‍රීඩාංගනයට උතුරු දිශාවෙනි. ක්‍රීඩාංගනයට දකුණු දිශාවෙන් පුස්තකාලය පිහිටා ඇත. එසේ නම්,


(1) පුස්තකාලයට දකුණු දිශාවෙන් පාසල පිහිටා ඇත.
(2) පාසල හා ක්‍රීඩාංගනය අතර පුස්තකාලය පිහිටා ඇත.
(3) පාසලට දකුණු දිශාවෙන් පුස්තකාලය පිහිටා ඇත.

**30.**




මෙම රූපයේ දැක්වෙන්නේ A හා B තැටිවල තබා ඇති ද්‍රව්‍යවල බර එකිනෙකට සමාන වන තරාදියකි.

ඒ අනුව, පහත දී ඇති තරාදියේ දෙපස බර සමාන වීම සඳහා B තැටියේ තැබිය යුතු ද්‍රව්‍ය මොනවා ද?




(1) ● ●
(2) ● ● ●
(3) ● ● ● ●

**31.** රෝද සංඛ්‍යාව වැඩි වන අනුපිළිවෙළට පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.

(1) කන්ටේනරය, මෝටර් රථය, ත්‍රිරෝද රථය, වීල්බැරෝව
(2) වීල්බැරෝව, ත්‍රිරෝද රථය, කන්ටේනරය, මෝටර් රථය
(3) වීල්බැරෝව, ත්‍රිරෝද රථය, මෝටර් රථය, කන්ටේනරය

**32.** $\triangle \times \square = 60$ සහ $\triangle - \square = 7$ නම්, $\triangle + \square$ හි අගය කීය ද?


(1) 15 (2) 16 (3) 17



**33.** හිස්කොටු දෙකට ගැළපෙන ගණිත කර්ම **දෙක** අනුපිළිවෙළින් තෝරන්න.

$343 \square 7 = 7 \square 7$

(1) +, × (2) ÷, × (3) ×, ÷

**34.** පහත රූප පේළියේ දැක්වෙන රටාව අනුව, හිස්තැන් දෙකට තිබිය යුතු රූප යුගලය තෝරන්න.



(1)  (2)  (3) 